කොවිඩ්-19 වසංගතය තව දුරටත් පාලනය කිරීමට නම්, ඒ පිළිබඳ මහ ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය බව සත්‍යයකි. මාධ්‍ය විසින් එය වගකීමක් ලෙසින් ගෙන ඉටු කිරීම අගය කළ යුතු වේ.

කෙසේ වෙතත්, අද දෙරණ පුවත් විකාශය (10/28) ඔස්සේ, කොවිඩ්-19 සඳහා හඳුන්වා දී ඇති අදාළ සෞඛ්‍ය මාර්ගෝපදේශ මහජනතාව විසින් අනුගමනය නොකිරීම පිළිබඳව වාර්තා කර තිබුණේ එම මාර්ගෝපදේශ කඩ කළ පුද්ගලයන්ගේ අනන්‍යතාවයන්ද හෙළිදරව් කරමිනි.

1) එසේ අනන්‍යතාවය හෙළි කිරීම තුළින්, කෙනෙකුගේ පෞද්ගලිකත්වය උල්ලංඝනය වේ යැයි ඔබ සිතන්නේද?
2) ඒ ඔස්සේ යමෙකුට සිය පුද්ගලිකත්වය සඳහා ඇති අයිතිය නැති නොවන්නේ ද?

මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?